AL/2018/32/S-II

58457

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உ யர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

2018.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) (අ) අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ආ) නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු **හතරක්** දක්වන්න.

(ආ) සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ගෝලීයකරණය යනු කුමක් දැ'යි අර්ථකථනය කර, එය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාත්මක බලපෑම් **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'සංවිධාන සංස්කෘතිය' යන්න අර්ථකථනය කරන්න.

(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් එක් උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක් දැ'යි පැහැදිලි කර, වර්තමාන සමාජය තුළ එය වැදගත්වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදනවල ගුණත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී, ඔහු විසින් සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** සඳහන් කර, එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) කෘෂි නිෂ්පාදන සඳහා පනවනු ලබන ආනයන බදු තුළින් බලපෑම් ඇති වන පාර්ශ්ව **හතරක්** නම් කර, එමගින් එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි **එක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර සාර්ථකව කරගෙන යාමට රජයක් විසින් විවිධාකාරයෙන් මැදිහත්වීම් සිදු කරනු ලැබේ. එසේ මැදිහත්වීමේ ක්‍රම **හතරක්** දක්වා, එම එක් එක් ක්‍රමය තුළින් රජයක් අපේක්ෂා කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) හවුල්කරුවන් අතර ආරවුල් හටගැනීමට බලපානු ලබන කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(v) වරලත්හිමියාට මෙන් ම වරලත්ලාභියාට ද ඉටු කළ යුතු කාර්ය සමූහයක් පවතී. වරලත්ලාභියකු විසින් ඉටු කළ යුතු කාර්ය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ දෙවැනි පිටුව බලන්න.

**3.** (i) රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද පවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපානු ලබන සාධක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) බොහෝ රටවල මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව විශාල වේ. එම සංඛ්‍යාව ඉහළ යාමට බලපානු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**4.** (i) (අ) රක්ෂණය කළ **නොහැකි** අවදානම් **හතරක්** සඳහා උදාහරණ සපයන්න.

(ආ) රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටු කරන කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) නුවරඑළියේ සිට කොළඹට පලතුරු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවාවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු **හතරක්** දක්වන්න.

(ආ) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීම සඳහා ඔබ විසින් කරන යෝජනා **හතරක්** හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) කළමනාකරණ සහකරුවන් සඳහා පැවැත්වූ පුහුණු සැසියකදී ලිපි ගොනු පවත්වා ගැනීම පිළිබඳ ඔබගේ දේශනයට සහභාගිවූවන්ගේ ප්‍රතිචාරය හොඳ මට්ටමක නොමැති බව කළමනාකාරිත්වය විසින් දන්වා ඇත. එවැනි ප්‍රතිචාරයක් ලැබීමට ඔබගේ දේශනයේදී සිදු විය හැකි දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ආ) බොහෝ ආයතන සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල භාවිත කරනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් සඳහා සුපිරි වෙළෙඳසැල්වලින් දැඩි තර්ජනයක් පවතී. සුපිරි වෙළෙඳසැල් වෙත පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වීමට හේතු **හතරක්** විස්තර කරන්න.

(ආ) ඇතැම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඇති තරගකාරිත්වයට මුහුණදීමට නොහැකි ය. එසේ නොහැකි වීමට හේතු වන ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'ගනුදෙනු කළ නොහැක' යන රේඛනය යෙදීමෙන් අණකරුට විශේෂිත වූ වාසියක් හිමි නොවේ. මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) විද්‍යුත් වෙළෙඳාම (e-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** (i) (අ) "අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ." මෙම නිර්වචනය පැහැදිලි කරන්න.

(ආ) පසුගිය සතියේ ඔබේ පාසලේ පැවති වාණිජ දිනය සංවිධානය කිරීමේ කණ්ඩායමෙහි ඔබ ද සාමාජිකයකු විය. එම දිනය පැවැත්වීම සඳහා ඔබ කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්ය **හතරක්** උදාහරණ ලෙස යොදා ගනිමින් කළමනාකරණ ශ්‍රිත විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කළමනාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතා යන්නට ඇතුළත් වන හැකියා **හතරක්** සඳහන් කරන්න.

(ආ) හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවල **නායකයා** සහ **ව්‍යවසායකයා** යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න. (ලකුණු 04 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

(iii) ව්‍යාපාර උපදේශන සමාගමක් විසින් ඔබට නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා නව සූර්ය බලශක්ති පද්ධතියක් හා නිෂ්පාදනාගාර ස්වයංක්‍රීයකරණය කිරීමේ පද්ධතියක් යෝජනා කර ඇත. මෙම විකල්පවලින් එකක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන අතර ඒ සඳහා මෙම විකල්ප ඇගයීමට යොදාගත හැකි නිර්ණායක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) (අ) ව්‍යාපාරයකට ඵලදායීතාවය වැදගත් වන්නේ ඇයි දැ'යි යන්න දැක්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදා ගනු ලබන පරිගණක ශිල්පීය ක්‍රමයක් වන 'පරිගණක ආධාරක නිර්මාණකරණය' (CAD) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි දක්වා එහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(ii) ඉන්ද්‍රපාල තම ප්‍රදේශයේ පැවැත්වූ අලුත් අවුරුදු පොළෙහි වෙළෙඳ කුටියක් කුලියට ගත් අතර, ඔහුගේ භාණ්ඩ සියල්ල ඒ හා සමාන භාණ්ඩ විකුණූ අනෙක් වෙළෙඳ කුටිවලට වඩා ඉක්මනින් අලෙවි විය. ඉන්ද්‍රපාලගේ වෙළෙඳ කුටියේ භාණ්ඩ සියල්ල ඉක්මනින් අලෙවි වීමට හේතු විය හැකි කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) නිෂ්පාදකයකු තම භාණ්ඩවලට ඇසුරුමක් යෙදීමට මැලිකමක් දක්වයි. ඇසුරුමකින් යුක්තව තම භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා නිෂ්පාදකයා උනන්දු කිරීම සඳහා යොදා ගත හැකි කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) විවිධ අරමුණු සඳහා ව්‍යාපාර විසින් ප්‍රචාරණය භාවිත කරනු ලැබේ. ප්‍රචාරණයේ අරමුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ධනසිරි විසින් කරගෙන යනු ලබන අත්‍යන්ත්‍ර රෙදිපිළි ව්‍යාපාරය එතරම් සාර්ථක නොවන බැවින් ඔහු හෝටලයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඔහුට අරමුදල් සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) නාමල්ගේ ව්‍යාපාරයේ ක්ෂණික අනුපාතය 2 : 1 වේ. මෙම තත්ත්වය ඇති වීමට බලපෑ හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** (i) (අ) ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) මානව සම්පත් කළමනාකරුවෙකු වශයෙන් ඔබ සේවය කරන ආයතනයට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පිළියෙල කරන අයදුම්පත්‍රයක ඇතුළත් විය යුතු තොරතුරු වර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව විවිධ පරීක්ෂණ පවත්වනු ලබයි. එසේ පවත්වනු ලබන පරීක්ෂණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න.

(ආ) පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමට අදහස් කරයි. එසේ සේවක සංඛ්‍යාව අඩු කළ හැකි ක්‍රම **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පහත දැක්වෙන්නේ ආයතනයක වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයකි.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 500 000 |
| ආරම්භක තොගය | 80 000 | |
| ගැනුම් | 300 000 | |
| | 380 000 | |
| අවසාන තොගය | (120 000) | 260 000 |

ඉහත දත්ත ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ හතරවැනි පිටුව බලන්න.

8. (i) (අ) තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.

(ආ) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න.

(ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට අදහස් කරයි. අන්තර්ජාලය භාවිත කිරීමෙන් ඔහුගේ ආයතන කටයුතු පහසු කර ගත හැකි ආකාර **හතරක්** විස්තර කරන්න.

(ආ) වලාකුළු (CLOUD) තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද? (ලකුණු 04 යි)

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු **දෙකක්** දක්වා, ව්‍යාපාරයක මුදල් ගලායාමට අදාළ අයිතම **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතරව සත්ත්ව ගොවිපළක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ඔබට බාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

## I කොටස

1. (i) (අ) අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| අවශ්‍යතාව | - | මිනිසාට ජීවත් වීම සඳහා පැවතිය යුතු මූලික දෑ |
| වුවමනා | - | අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට කිසියම් පුද්ගලයකු යම්කිසි නිෂ්පාදිතයකට දක්වන විශේෂ කැමැත්ත / පුද්ගලයෙකු සිය අවශ්‍යතාවය තෘප්තිමත් කර ගන්නා ආකාරය |
| නිෂ්පාදිත | - | අවශ්‍යතා හා උවමනා තෘප්තිමත් කිරීමට ඉදිරිපත් කෙරෙන ඕනෑම දෙයකි. |

*ලකුණු 1/2 x 3 ලකුණු 1 1/2 යි*

අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයින් පදනම් කර ගන්නා විවිධ ක්‍රම වුවමනා වන අතර ඒ සඳහා ඇති විසඳුම් නිෂ්පාදිත වේ.

අවශ්‍යතා (පදනම) ⟶ වුවමනා (ක්‍රමය) ⟶ නිෂ්පාදිතය (විසඳුම)

(ලකුණු 1/2 )

(ආ) නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

1. පුද්ගල විශේෂිකරණය
2. අතිරික්ත නිෂ්පාදනය
3. භාණ්ඩ හුවමාරුව
4. වෙළෙඳාම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ii) (අ) නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු **හතරක්** දක්වන්න.

1. අස්වැන්නේ ආදායමේ ඇති අවිනිශ්චිතතාව
2. වෘත්තිමය වශයෙන් යහපත් ප්‍රතිරූපයක් ඇති නොවීම
3. සමාජ පිළිගැනීමක් ඇති නොවීම
4. ප්‍රාග්ධන ගැටළු පැන නැගීම
5. හොඳ වෙළෙඳපොලක් නොමැති වීම
6. කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය කුසලතා නොමැති වීම
7. අධ්‍යාපන ක්‍රමයෙන් කෘෂි කර්මාන්තය පිළිබඳව දැනුම ආකල්ප හා කුසලතා අවශ්‍ය පරිදි නොලැබීම
8. පුද්ගල ආකල්ප

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

1. රාජ්‍ය සංස්ථා / අධිකාරි / මණ්ඩල / කොමිෂන් සභා
2. රාජ්‍ය දෙපාර්තමේන්තු
3. රාජ්‍ය සමාගම්
4. ප්‍රාදේශීය අධිකාරිය යටතේ පවතින ව්‍යාපාර

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) වරලත්හිමියාට මෙන් ම වරලත්ලාභියාට ද ඉටු කළ යුතු කාර්ය සමූහයක් පවතී. වරලත්ලාභියකු විසින් ඉටු කළ යුතු කාර්ය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. වරලත් හිමියා පනවනු ලබන කොන්දේසි අනුව කටයුතු කිරීම
2. ප්‍රාග්ධනය ආයෝජන කිරීම
3. වරලත් හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම
4. වරලත් හිමියාට ගිවිසගත් පරිදි පුරස්කාරය ගෙවීම

*ලකුණු 1 x 4 ලකුණු 4 යි*

**3.** (i) රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද පවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

1. තම හැකියා හා දක්ෂතා වලින් ප්‍රයෝජන ගත හැකි වීම
2. ස්වාධීනව හා තම අභිමතය පරිදි කටයුතු කළ හැකි වීම
3. තම කැපවීම හා උනන්දුවමත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම
4. රැකියාවකින් යැපෙන්නකු නොව රැකියා ජනිත කරන්නෙකු විය හැකි වීම
5. සමාජ තත්වය හා ඉහළ පිළිගැනීමක් ඇති වීම
6. තමගේ ප්‍රධානියා තමාම වීම
7. ආත්ම තෘප්තියක් ලබා ගත හැකි වීම
8. රැකියාවකින් ලබන වැටුප නිශ්චිත වුවත් තම ව්‍යාපාරයකින් ලබන අදායම් සීමාවක් නොමැති වීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපාන ලබන සාධක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපන ක්‍රමයේ සහයෝගය අඩු වීම
2. ව්‍යවසායකත්ව වර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
3. මූල්‍ය සහයෝගය අඩු වීම
4. නෛතික හා බදු ප්‍රතිපත්ති රාමුව ව්‍යවසායකයන් ඇති කරීමට යෝග්‍ය නොවීම
5. ව්‍යවසායකත්වය පිළිබඳව ඇති සංස්කෘතික වටිනාකම් හා සමාජ ආකල්ප යහපත් නොවීම
6. අවදානම් දැරීමට ඇති අකමැත්ත
7. නිර්මාණශීලිව හා නවෝත්පාදන හැකියාවකින් යුත් පුද්ගලයන් බිහිවීමේ අඩුකම/ ව්‍යවසායකත්ව පෞරුෂත්වයකින් යුත් පුද්ගලයන්ගේ අඩුකම
8. පර්යේෂණ හා සංවර්ධන සඳහා වැඩි අවධානයක් යොමු නොවීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(iii) බොහෝ රටවල මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව විශාල වේ. එම සංඛ්‍යාව ඉහළ යාමට බලපානු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

1. කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනයෙන් ආරම්භ කළ හැකි වීම
2. ඕනෑම ස්ථානයක ආරම්භ කළ හැකි වීම
3. මහා පරිමාණ ව්‍යාපාර අත නොගසන ව්‍යාපාර ක්ෂේත්‍රයන්ට යොමු වීම
4. දැඩි නෛතික කොන්දේසි බල නොපැවැත්වීම
5. ඕනෑම ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යටතේ වුවද ආරම්භ කළ හැකි වීම
6. මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අනෙකුත් සේවා හා යෙදවුම් සැපයීම
7. විවිධ දිරිගැන්වීම් හා අනුග්‍රහයන් ලැබීම

*මීට අමතරව*

8. අඩු සේවක සංඛ්‍යාවකින් පවත්වාගෙන යා හැකිවීම නිසා සේවක පිරිවැය අඩු වීම
9. ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
2. කල්බදු මූල්‍යකරණය
3. ණය සැපයීම
4. කාලීන තැන්පතු භාර ගැනීම
5. මුදල් හුවමාරුව සඳහා පහසුකම් සැපයීම
6. කොටස් ප්‍රාරක්ෂණය

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**වාසි**

1. ගනුදෙනු කිරීමේ පිරිවැය අඩු වීම
2. මුදල් එහා මෙහා ගෙනයාමේ අවදානම ඉවත් වීම
3. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම
4. ගෙවීම් කටයුතු පහසු වීම/ වේගවත් වීම
5. විවිධ ප්‍රතිලාභ හිමි වීම
6. විදේශ ගනුදෙනු සඳහා ද භාවිතා කළ හැකි වීම (ගෝලීය පිවිසුම)

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

**අවාසි**

1. පොලී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම
2. වංචනික ක්‍රියා සිදු විය හැකි වීම
3. අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
4. තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා සිදු වීම
5. සියලුම ගනුදෙනුකරුවන්ට විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නොමැති වීම
6. විද්‍යුත් මුදලින් ගනුදෙනු කළ හැකි අවස්ථා සීමිත වීම
7. විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ සීමාවන් පැවතීම

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

4. (i) (අ) රක්ෂණය කළ නොහැකි අවදානම් හතරක් සඳහා උදාහරණ සපයන්න.

(ආ) රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටු කරන කාර්ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. විභාග අසමත් වීම

2. ආදරය හා සෙනෙහස අහිමි වීම

3. යල් පැනීම, ක්ෂය වීම, මල බැඳීම වැනි ස්වාභාවික හේතු

4. වැරදි කළමනාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාර අලාභ

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

(ආ) 1. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

2. රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියා පදිංචි කිරීම

3. රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අත්හිටුවීම

4. රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම

5. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම

6. රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

7. රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්දක් පැනවීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ii) (අ) නුවරඑළියේ සිට කොළඹට පළතුරු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවාවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු හතරක් දක්වන්න.

(ආ) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීම සඳහා ඔබ විසින් කරන යෝජනා හතරක් හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. පළතුරුවල ස්වභාවය

2. වේගවත් බව

3. ධාරිතාව

4. සුරක්ෂිත බව

5. සුලබ බව

6. පිරිවැය

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) 1. භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු දුම්රිය මැදිරි නවීකරණය කිරීම

2. විශාල ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වනසේ දුම්රිය මැදිරි ප්‍රමාණය වැඩි කිරීම

3. ගමනාන්තය දක්වා ගමන් කළ හැකි වන සේ අනෙකුත් මාධ්‍යයන්හි සම්බන්ධතා ගොඩනැගීම

4. GPS තාක්ෂණය මඟින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ පිළිබඳව තොරතුරු ලබා ගත හැකිසේ පහසුකම් සැපයීම

5. විවිධ භාණ්ඩවලට ගැළපෙන සේ පහසුකම් ඇති දුම්රිය මැදිරි යොදා ගැනීම

උදා : ශීතාගාර පහසුකම් සහිත මැදිරි

6. ප්‍රධාන දුම්රිය ස්ථානවල සිට, ව්‍යාපාර ස්ථාන, බස් නැවතුම්පොළ ද ආදී ස්ථාන සම්බන්ධ කරන විද්‍යුත් දුම්රිය ජාලයක් ස්ථාපිත කිරීම

7. භාණ්ඩ පැටවීමේ දී හා බෑමේ දී සුරක්ෂිතව සිදු කළ හැකි නවීන තාක්ෂණික උපකරණ හඳුන්වා දීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(iii) (අ) කළමනාකරණ සහකරුවන් සඳහා පැවැත්වූ පුහුණු සැසියකදී ලිපි ගොනු පවත්වා ගැනීම පිළිබඳ ඔබගේ දේශනයට සහභාගිවූවන්ගේ ප්‍රතිචාරය හොඳ මට්ටමක නොමැති බව කළමනාකාරිත්වය විසින් දන්වා ඇත. එවැනි ප්‍රතිචාරයක් ලැබීමට ඔබගේ දේශනයේදී සිදු විය හැකි දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ආ) බොහෝ ආයතන සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල භාවිත කරනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. පැහැදිලිව හා නිරවුල්ව මෙන්ම සරලව කරුණු ඉදිරිපත් නොකිරීම

2. අදාළ උදාහරණ භාවිත නොකිරීම

3. අනවශ්‍ය විස්තර කිරීම්

4. හඬ පාලනය හා නිවැරදි උච්චාරණය නොමැති වීම

5. හැඟීම් හා ඉඟි පැහැදිලි නොවීම

6. ප්‍රේක්ෂකයින් හා දේශකයා අතර සම්බන්ධතාවයක් නොමැති වීම

7. ප්‍රේක්ෂක අවධානය ලබා ගත නොහැකි වීම

8. ප්‍රතිපෝෂණය ලබා නොගැනීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) *වාසි*

1. පිරිවැය අඩු වීම

2. වේගවත් වීම

3. විශ්වාසදායී වීම



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

4. පණිවුඩ යැවූ බව තහවුරු කර ගත හැකි වීම
5. ඕනෑම ස්ථානයක සිට පණිවුඩ හුවමාරු කළ හැකි වීම
6. එකම අවස්ථාවක දී පාර්ශව කිපයකට පණිවුඩ හුවමාරු කළ හැකි වීම
7. තොරතුරු ගබඩා කරගත හැකි වීම
8. ශබ්ද හා රූප යැවීමට හැකි වීම
9. ඉක්මණින් ප්‍රතිචාර ලබාගත හැකි වීම
10. ලිපිද්‍රව්‍ය භාවිතයක් නොමැති වීම
11. විශාල තොරතුරු ප්‍රමාණයක් එකවර හුවමාරු කරගත හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

*අවාසි*

1. තාක්ෂණික බාධා ඇතිවිය හැකි වීම
2. පණිවුඩය නිවැරදිව තේරුම් නොගැනීම
3. අන්තර්ජාල පහසුකම් ව්‍යාප්තිය අඩුවීම
4. පරිගණක සාක්ෂරතාවය අඩු වීම
5. සජීවි නොවීම
6. වෛරස් බලපෑම් ඇතිවිය හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(iv) (අ) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් සඳහා සුපිරි වෙළෙඳසැල්වලින් දැඩි තර්ජනයක් පවතී. සුපිරි වෙළෙඳසැල් වෙත පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වීමට හේතු හතරක් විස්තර කරන්න.

(ආ) ඇතැම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඇති තරගකාරිත්වයට මුහුණදීමට නොහැකි ය. එසේ නොහැකි වීමට හේතු වන ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(අ)
1. ආකර්ෂණීය බව, පිරිසිදු බව යන ගුණාංගවලින් යුක්ත වීම
2. රථ වාහන නතර කිරීමේ ස්ථාන වෙන් කර තිබීම
3. භාණ්ඩ තෝරා ගැනීමේ පහසුකම් පැවතීම
4. බැංකු ශාඛා, ස්වයංක්‍රීය බැංකු සේවා වැනි පහසුකම් පැවතීම
5. විද්‍යුත් මුදල් මගින් ගනුදෙනු කළ හැකි වීම
6. වායු සමනය කර තිබීම
7. අමතර පහසුකම් සලසා තිබීම
8. විවිධ භාණ්ඩ වර්ග එක් ස්ථානයකින් ලබා ගැනීමට හැකි වීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) පාලනය කළ හැකි

1. ජාත්‍යන්තර වෙළෙඳපොලට ගැළපෙන සේ ගුණත්වය පවත්වා ගැනීමට කටයුතු නොකිරීම්
2. ජාත්‍යන්තර වෙළෙඳපොළට ගැළපෙන සේ භාණ්ඩ සැලසුම් කිරීම, මෝස්තරකරණය හා සංවර්ධනය සිදු නොකිරීම
3. යෝග්‍ය ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රම යොදා නොගැනීම
4. අයෝග්‍ය මිල ප්‍රතිපත්ති භාවිතය
5. ගනුදෙණුකාර සේවා ප්‍රමාණවත් නොවීම
6. අවශ්‍ය කුසලතා සහිත සේවකයන් නොමැති වීම

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

පාලනය කළ නොහැකි

1. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
2. සහායක කර්මාන්ත දියුණු වීම
3. රජයේ ප්‍රතිපත්ති
4. රජයේ දුර්වල ජාත්‍යයන්තර සම්බන්ධතා
5. රාජ්‍ය අනුග්‍රහය දුර්වල වීම
6. සේවක වැටුප් හා වෙනත් පිරිවැය ඉහළ යාම
7. ජාත්‍යන්තර වෙළෙඳාමට සහාය වන ආයතන හා පද්ධතිවල ආකාර්යක්‍ෂමතාවය හා දැඩි නීතිරීති

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) (අ) 'ගනුදෙනු කළ නොහැක' යන රේඛනය යෙදීමෙන් අණකරුට විශේෂිත වූ වාසියක් හිමි නොවේ. මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ආ) විද්‍යුත් වෙළෙඳාම (e-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(අ) එකඟ නොවේ (ලකුණු 1 /2 )

"ගනුදෙනු කළ නොහැක" යන රේඛනයෙන් චෙක්පත ගනුදෙනු කළ නොහැකි ලියවිල්ලක් බවට පත්වන නිසා එවැනි චෙක්පතක් ලබා ගන්නෙකු අයිතියේ ඉතිහාසය පරීක්ෂා කළ යුතු යැයි ඇඟවීමක් මින් කරයි. එම නිසා මෙවැනි චෙක්පතක් නිරායාසයෙන් එකිනෙකා අතර පැවරීම සීමා වන හෙයින් ආදායකයාම මුදල් අය ලබා ගැනීම තහවුරු වේ. එසේම චෙක්පත පැවරීමේ ඉතිහාසයේ වංචාවක් සිදු වී ඇත්නම් එහිදී අණකරුගේ වගකීමක් ද නැත. එමනිසා මෙම ප්‍රකාශයට එකඟ විය නොහැක.

අණකරු ආදායකයාට මුදල් ගෙවූ බවට මෙම රේඛනය මගින් සහතික කෙරේ. මෙමගින් චෙක්පත සාරකම් කිරීම් හා වංචා කිරීම් අණකරුගේ වගකීමෙන් නිදහස් වේ.

*(ඉරි ඇඳි පද ඇතිනම් ලකුණු 1 1/2යි)*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ)

- දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කටයුතු කළ හැකි වීම
- ආරම්භක පිරිවැය අඩු වීම
- ගනුදෙනු වේගවත් වීම
- වෙළඳපොළ පුළුල් වීම
- මිල මට්ටම සාපේක්ෂව අඩු වීම/ අතරමැදියන් නොමැති වීම
- භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
- ගණුදෙනුවලට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම
- තම භාණ්ඩ පරිහරණයට අවස්ථාව ලැබීම
- ලියකියවිලි භාවිතය අඩු වීම
- ගනුදෙනු සම්පූර්ණයෙන් විනිවිද භාවයෙන් යුක්ත වීම
- තොග පවත්වාගෙන යාමට අවශ්‍ය නොවීම
- වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය නොවීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

## II කොටස

5. (i) (අ) "අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ." මෙම නිර්වචනය පැහැදිලි කරන්න.

(ආ) පසුගිය සතියේ ඔබේ පාසලේ පැවති වාණිජ දිනය සංවිධානය කිරීමේ කණ්ඩායමෙහි ඔබ ද සාමාජිකයකු විය. එම දිනය පැවැත්වීම සඳහා ඔබ කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්ය **හතරක්** උදාහරණ ලෙස යොදා ගනිමින් කළමනාකරණ ශ්‍රිත විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) කළමනාකරුවෙකු කාර්යයන් ඉටුකරන්නෙකු නොව කාර්යයන් ඉටුකරවා ගන්නෙකි. ඒ සඳහා නිශ්චිත රටාවක් නොමැත. අවස්ථාව අනුව එම කාර්යයන් ඉටු කරවා ගැනීමට කළමනාකරුවෙකු සමත් විය යුතු ය. ඒ සඳහා විවිධ රටා හා ක්‍රම ඔහුට අනුගමනය කළ හැකිය. ආයතනයේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ඉටු කර ගත හැක්කේ කළමනාකරුවෙකුගේ ශෛලීය අනුවය.

*(ඉරි ඇඳි පද සහිත සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)*

ආ. සැලසුම්කරණය

- වාණිජ දිනයේ තේමාව අරමුණ ස්ථාපිත කිරීම
- වාණිජ දිනය තීරණය කිරීම
- අමුත්තන් හා ආරාධිත පාසැල් තීරණය කිරීම
- අනුග්‍රහකයන් හා අරමුදල් පිළිබඳ තීරණ
- පාසල් අනුමැතිය හා අවශ්‍ය ශාලා වෙන් කරගැනීමේ අනුමැතිය

*එක් කරුණකට ලකුණු 1/2 යි*

සංවිධානකරණය

- වාණිජ දිනට පෙර කාර්යයන් හඳුනා ගැනීම
- වාණිජ දින කාර්යයන් වෙන් කර හඳුනා ගැනීම
- ඒ ඒ කණ්ඩායම්වලට වැඩ බෙදීම
- මුදල් කමිටුව, සංග්‍රහ කමිටුව, සන්නිවේදනය කමිටුව ආදි වශයෙන් වෙන් කිරීම
- ඒ ඒ කමිටුවට බලතල වගකීම් පවරා දීම
- සම්පත් වෙන්කර දීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

මෙහෙයවීම

- මුදල් සංග්‍රහ සන්නිවේදන ආදී කමිටුවල වගකීම් දරන්නන්ගේ අවශ්‍යතා විමසීම
- ඒ ඒ කමිටු අතර පොදු කරුණු පිළිබඳ දැනුවත් කිරීම
- ඒ ඒ කමිටුවල කටයුතු කරන සිසුන් උද්යෝගීමත් කිරීම හා වාණිජ දිනයේ කටයුතු කිරීමට යොමු කිරීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*

පාලනය

- න්‍යාය පත්‍රයේ සඳහන් අයිතම ඒ ඒ වෙලාවට සිදුවීම සහතික කිරීම
- අමුත්තන් පිළිගැනීම, සංග්‍රහ කිරීම සහ අනෙකුත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*

(ii) (අ) කළමනාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතා යන්නට ඇතුළත් වන හැකියා **හතරක්** සඳහන් කරන්න.
(ආ) හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවල **නායකයා** සහ **ව්‍යවසායකයා** යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ)

1. අභ්‍යන්තර හා බාහිර පරිසර බලපෑම් හඳුනාගැනීමේ හැකියාව
2. සමස්තය විශ්ලේෂණය කිරීමේ හැකියාව
3. ගැටලු තේරුම් ගැනීමේ හා විසඳීමේ හැකියාව
4. දූරදර්ශීභාවය
5. තීක්ෂණව සිතීමේ හැකියාව
6. තීරණ ගැනීමේ හැකියාව

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

ආ. නායකයා

1. සේවක කටයුතු අගය කිරීම
2. ගුණදොස් දැක්වීම
3. සේවකයින් උසස් කිරීම හා ඉවත් කිරීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

ව්‍යවසායකයා

1. නව ව්‍යාපෘති හඳුන්වා දීම
2. ක්‍රියාවලි හඳුන්වා දීම
3. සංවිධාන ව්‍යුහය වෙනස් කිරීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iii) ව්‍යාපාර උපදේශන සමාගමක් විසින් ඔබට නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා නව සූර්ය බලශක්ති පද්ධතියක් හා නිෂ්පාදනාගාර ස්වයංක්‍රීයකරණය කිරීමේ පද්ධතියක් යෝජනා කර ඇත. මෙම විකල්පවලින් එකක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන අතර ඒ සඳහා මෙම විකල්ප ඇගයීමට යොදාගත හැකි නිර්ණායක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

| | | | |
|---|---|---|---|
| 1. | පිරිවැය | - | ක්‍රම 2 ට අදාළ පිරිවැය සැසඳීම |
| 2. | භාවිත කිරීමේ හැකියාව | - | අදාළ කාර්යයට යොදා ගත හැකිද? යන්න |
| 3. | භාවිත කිරීමේ යෝග්‍යතාව | - | අදාළ කාර්යයට සුදුසුද? යන්න |
| 4. | සාපේක්ෂ වැදගත්කම | - | ආයතනයට සඵලදායී වන විකල්ප කුමක්ද? |
| 5. | පරිසර හිතකාමී බව | - | පරිසරයට සිදු කරන බලපෑම |
| 6. | කල් පැවැත්ම | - | කොතරම් කාලයක් පාවිච්චි කළ හැකිද? යන්න |
| 7. | තාක්ෂණික ශක්‍යතාව | - | අමතර කොටස් පිළිබඳව. අලුත්වැඩියාව හා ක්‍රියාකරවන්නන් පිළිබඳ |
| 8. | පිළිගැනීම | - | ආයතනයේ පිළිබඳව අනෙකුත් පාර්ශවයන්ගේ කැමැත්ත |
| 9. | පැවැත්ම | - | තාක්ෂණය යල් පැනීමට ඇති ඉඩකඩ |

*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*
*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. කාර්ය හඳුනා ගැනීම
2. වැඩ බෙදීම
3. දෙපාර්තමේන්තුකරණය
4. අධිකාරිය හා වගකීම් පැවරීම
5. වැඩ කිරීමේ ප්‍රමිති ඇති කිරීම
6. සම්පත් බෙදා දීම
7. සමායෝජනය

*පියවර 4 ක් නම් කිරීමට ලකුණු 1/2*
*පියවර 7 ම නම් කිරීමට ලකුණු 1/2*
*විස්තර කිරීමට ලකුණු 1 x 3 ලකුණු 03 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ලකුණු 04 යි)

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවීම
3. ද්‍රව්‍ය භාවිත කිරීමේ පිරිවැය අඩුකරගත හැකි වීම
4. ද්‍රව්‍ය හා සේවකයින් චලනය වීමේ දී ඇතිවිය හැකි බාධා අවම වීම
5. අනතුරු අවම වීම
6. සමායෝජනය හා සුපරීක්ෂණය පහසු වීම
7. සේවකයින්ගේ චිත්ත ධෛර්ය ඉහළ යාම

*කරුණු 4 ට ලකුණු 1/2බැගින් ලකුණු 02 යි*

ආ.

1. තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය
2. ABC විශ්ලේෂණය
3. ද්විත්ව භාජන ක්‍රමය
4. පරිගණක වැඩසටහන් ක්‍රමය
5. අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය
6. JIT ක්‍රමය

*කරුණු 4 ට ලකුණු 1/2බැගින් ලකුණු 02 යි*

**6.** (i) (අ) ව්‍යාපාරයකට ඵලදායීතාවය වැදගත් වන්නේ ඇයි දැ'යි යන්න දැක්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදා ගනු ලබන පරිගණක ශිල්පීය ක්‍රමයක් වන 'පරිගණක ආධාරක නිර්මාණකරණය' (CAD) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි දක්වා එහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(අ) 1. ව්‍යාපාරයේ සම්පත් බෙදා හැරීම පිළිබඳ තීරණ ගැනීමට

2. ව්‍යාපාරය පුළුල් කිරීම පිළිබඳ තීරණ ගැනීමට

3. සෙසු සමාන ආයතන සමග ඵලදායීතාව සංසන්දනය කිරීමට

4. ව්‍යාපාර ආයතනයේ ප්‍රගතිය අවබෝධ කර ගැනීමට

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) පරිගණක මෘදුකාංග භාවිතා කොට ගෙන භාණ්ඩ නිර්මාණය කිරීමයි

*ලකුණු 01 යි*

*වාසි*

1. අපතේ යාම් අවම කිරීම
2. භාණ්ඩ නිපදවීමේදී ත්‍රිමාණ හා ද්විමාන ආකෘති මගින් සංවර්ධනය කළ හැකි වීම
3. ලෝකයේ විවිධ ස්ථානවල නිර්මාණය කරන භාණ්ඩ ඒ ඒ ස්ථානවල සිටම හෝ වෙනත් ස්ථානවල සිට වැඩි දියුණු කළ හැකි වීම
4. භාණ්ඩ නිර්මාණය හා සංවර්ධනය කිරීමේ පිරිවැය අඩු වීම
5. අවසාන නිෂ්පාදිතය නිපදවීමට පෙර අවශ්‍ය දියුණු කිරීම් කළ හැකි වීම
6. ඵලදායීතාව වැඩිකර ගත හැකි වීම
7. ගුණාත්වය වැඩිකර ගත හැකි වීම
8. සන්නිවේදනය වර්ධනය වීම
9. නිෂ්පාදනයට අවශ්‍ය දත්ත පදනමක් ගොඩ නගා ගත හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(ii) ඉන්ද්‍රපාල තම ප්‍රදේශයේ පැවැත්වූ අලුත් අවුරුදු පොළෙහි වෙළෙඳ කුටියක් කුලියට ගත් අතර, ඔහුගේ භාණ්ඩ සියල්ල ඒ හා සමාන භාණ්ඩ විකුණූ අනෙක් වෙළෙඳ කුටිවලට වඩා ඉක්මනින් අලෙවි විය. ඉන්ද්‍රපාලගේ වෙළෙඳ කුටියේ භාණ්ඩ සියල්ල ඉක්මනින් අලෙවි වීමට හේතු විය හැකි කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

| | | |
|---|---|---|
| 1. මිල සාපේක්ෂව අඩුවිය හැකි බව | - | අනෙකුත් භාණ්ඩ හා සසඳන විට මිල අඩු වීම |
| 2. පෞද්ගලික අලෙවි නිපුණතා | - | ඔහුගේ පෞද්ගලික ආකර්ෂණීය ගුණාංග |
| 3. ආකර්ශණීය ඉදිරිපත් කිරීම | - | භාණ්ඩය පෙළ ගස්වා ඇති ආකාරය ආකර්ෂණීය වීම |
| 4. ප්‍රදර්ශන කුටිය පිහිටි ස්ථානය | - | පාරිභෝගිකයන්ට වඩා පහසු ස්ථානයක පිහිටීම |
| 5. ඔහු භාවිතා කරනු ලැබූ ප්‍රවර්ධන ක්‍රමය | - | අනෙකුත් විකුණුම් කරුවන්ගේ ප්‍රවර්ධන ක්‍රමවලට වඩා ගැනුම්කරුවන් ආකර්ෂණය කරගත හැකි ක්‍රමයක් වීම |

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*
*විස්තර කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iii) (අ) නිෂ්පාදකයකු තම භාණ්ඩවලට ඇසුරුමක් යෙදීමට මැලිකමක් දක්වයි. ඇසුරුමකින් යුක්තව තම භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා නිෂ්පාදකයා උනන්දු කිරීම සඳහා යොදා ගත හැකි කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

අ.

1. ඇසුරුම් සහිත භාණ්ඩ සඳහා පාරිභෝගික ආකර්ෂණය ඉහළ වීම
2. ව්‍යාපාරයේ හා සන්නාමෙහි ප්‍රතිරූපය ඉහළ යාම
3. භාණ්ඩයට ආරක්ෂාවක් ලැබීම
4. භාණ්ඩය පිළිබඳ තොරතුරු සැපයිය හැකි වීම
5. ප්‍රවර්ධනය පහසු වීම
6. භාණ්ඩ ප්‍රදර්ශනයට පහසු වීම
7. භාණ්ඩ ගබඩාකරණයට හා ප්‍රවාහනයට පහසු වීම
8. ස්වයං සේවා ක්‍රමයට අලෙවිය පහසු වීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

ආ.

1. වෙළෙඳපොළ තුළ රැඳී සිටීම
2. වර්තමාන ලාභ උපරිම කිරීම
3. වෙළෙඳපොළ කොටස උපරිම කිරීම
4. වෙළෙඳපොළ සාරය උරා ගැනීම
5. නිෂ්පාදිත ගුණාත්ව නායකත්වය ලැබීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. දැනුම් දීම - නිෂ්පාදිතය පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම
2. පෙළඹවීම - මිළදී ගැනීමට උනන්දුවක් ඇති කිරීම
3. දිරි ගැන්වීම - යෝග්‍යතාව තහවුරු කිරීම
4. සිහි ගැන්වීම - පාරිභෝගිකයාගේ මතකයෙහි රඳවා තැබීම

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.
(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

අ. 1. ඉතිරිකිරීම්
2. බැංකු ණය
3. වත්කම් විකිණීම
4. පෞද්ගලික ණය
5. හවුල්කරුවෙකු බඳවා ගැනීම
6. කල්බදු
7. කුලිපිට ගැනුම්

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

ආ.
1. ණයගැතියන්ගේ වටිනාකම වැඩි වීම
2. අතැති මුදල් ප්‍රමාණය වැඩි වීම
3. බැංකු ශේෂය ඉහළ වීම
4. ලැබිය යුතු ආදායම වැඩි වටිනාකමකින් යුක්ත වීම *ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(මුළු ලකුණු 20 යි)

7. (i) (අ) ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.
(ආ) කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. බැංකු අයිරා
2. වාණිජ පත්‍රිකා
3. ගෙවිය යුතු වියදම් පමා කිරීම
4. කෙටි කාලීන බැංකු ණය
5. වෙළෙඳ ණය
6. බදු වෙන් කිරීම්
7. ලාභාංශ වෙන් කිරීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) 1. සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ වීම

2. සමාගම් කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම

3. සමාගම් කොටස් සඳහා ද්විතීයික වෙළෙඳ පොළක් හිමි වීම

4. උපාය මාර්ගික අයෝජකයන් ආකර්ශනය කරගත හැකි වීම

5. ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් ඇති කර ගත හැකි වීම

6. සමාගමේ විශ්වාසනීය බව ඉහළ යාම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(ii) මානව සම්පත් කළමනාකරුවෙකු වශයෙන් ඔබ සේවය කරන ආයතනයට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පිළියෙල කරන අයදුම්පත්‍රයක ඇතුළත් විය යුතු තොරතුරු, වර්ග **හතරක්** විස්තර කරන්න.
(ලකුණු 04 යි)

1. පුද්ගලික තොරතුරු - නම, උපන්දිනය, වයස, ලිපිනය වැනි

2. අධ්‍යාපන සුදුසුකම් - විභාග සමත් වීම ආදිය

3. වෘත්තීය සුදුසුකම් - රැකියාවට අදාළ වෙනත් සුදුසුකම්

4. රැකියා ඉතිහාසය (පළපුරුද්ද) - රැකියාවට අදාළ කාර්යයන් කළ කාලය පිළිබඳ

5. තොරතුරු ලබා ගත හැකි පුද්ගලයින් පිළිබඳ විස්තර - ඥාති සම්බන්ධතාවක් නොමැති පුද්ගලයන්ගේ නම, තනතුර, ලිපිනය, දුරකථන අංකය, ආදිය

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(iii) (අ) රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව විවිධ පරීක්ෂණ පවත්වනු ලබයි. එසේ පවත්වනු ලබන පරීක්ෂණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න.

(ආ) පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

අ. 1. සේවානියුක්ත විභාග

2. වෛද්‍ය පරීක්ෂණ

3. පසුබිම් පරීක්ෂණ

4. ප්‍රායෝගික පරීක්ෂණ

*නම් කිරීමට ලකුණු 1/2 x 2 බැගින් ලකුණු 01 යි*

*විස්තර කිරීමට ලකුණු 1/2 x 2 බැගින් ලකුණු 01 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

ආ. 1. රැකියාව පිළිබඳ කොන්දේසි

2. රැකියාව පිළිබඳ නියමයන්

3. කාර්යයන්

4. යුතුකම් හා වගකීම්

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(iv) පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමට අදහස් කරයි. එසේ සේවක සංඛ්‍යාව අඩු කළ හැකි ක්‍රම **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම
2. වන්දි ලබා දී ඉවත් කිරීම
3. වෙනත් ආයතනයකට යොමු කිරීම
4. නව බඳවා ගැනීම් නතර කිරීම
5. නැවත පුහුණුව ලබා දී වෙනත් රැකියාවලට යොමු කිරීම

*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) පහත දැක්වෙන්නේ ආයතනයක වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයකි.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 500 000 |
| ආරම්භක තොගය | 80 000 | |
| ගැනුම් | 300 000 | |
| | 380 000 | |
| අවසාන තොගය | (120 000) | 260 000 |

ඉහත දත්ත ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

v.

1. විකුණුම් පිරිවැය
2. දළ ලාභය
3. දළ ලාභ අනුපාතය
4. තොග පිරිවැටුම් සීඝ්‍රතාවය/ අනුපාතය
5. තොග පිරිවැටුම් කාලය

*ලකුණු 1 x 4 - ලකුණු 04 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

8. (i) (අ) තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.
(ආ) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න.
(ලකුණු 04 යි)

(අ) 1. ආයතනයක් සතු පරිගණක තාක්‍ෂණය හා සන්නිවේදන තාක්‍ෂණය මැනවින් හසුරවිමින් තොරතුරු සම්පත කාර්යක්‍ෂමව හා සඵලදායී භාවිත කිරීමේ දි ක්‍රියාවලිය තොරතුරු කළමනාකරණ තාක්‍ෂණයයි.

*ලකුණු 02*

(ආ) 1. වඩා නිවැරදි තීරණ ගත හැකි වීම
2. කටයුතුවල වැරදි අවම වීම
3. ක්‍රියාවලි කාර්යක්‍ෂමව සිදු කර ගත හැකි වීම
4. ක්‍රියාවලිය සඵලදායීව සිදු කරගත හැකි වීම
5. නිමැවුම්වල ගුණාත්මක භාවය ඉහළ යාම
6. තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවක් පැවතීම
7. පිරිවැය අඩු වීම
8. තරගයට මුහුණ දිය හැකි වීම
9. සන්නිවේදන ක්‍රියාවලිය පහසු වීම
10. පාරිභෝගිකයන් හෝ සේවාදායකයින් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව
11. අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණය වීම

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට අදහස් කරයි. අන්තර්ජාලය භාවිත කිරීමෙන් ඔහුගේ ආයතන කටයුතු පහසු කර ගත හැකි ආකාර **හතරක්** විස්තර කරන්න.
(ආ) වලාකුළු (CLOUD) තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.
(ලකුණු 04 යි)

(අ) 1. නිෂ්පාදිත ප්‍රවර්ධනය පහසු වීම
2. සේවක ආකර්ෂණය පහසු වීම
3. වෙළෙඳ ගනුදෙනු කාර්යක්‍ෂමව සිදු කළ හැකි වීම/ වෙළෙඳපොල සොයා ගැනීමට හැකි වීම
4. දත්ත ගබඩා කර තබා ගත හැකි වීම
5. සන්නිවේදන කටයුතු පහසුවෙන් කළ හැකි වීම/ ක්‍ෂණිකව තොරතුරු ලබා ගැනීමට හැකි වීම



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

6. ව්‍යාපාර කටයුතු බාහිර පාර්ශවයන් ට පවරා සිදු කළ හැකි වීම
7. ව්‍යාපාර කටයුතු අධීක්ෂණය හා නියාමනය පහසු වීම
8. G.P.S. තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාර කටයුතු පහසු කර ගත හැකි වීම
9. ජංගම සේවක පිරිසක් පවත්වා ගත හැකි වීම
10. පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම
11. කඩදාසි භාවිතය අවම කර ගත හැකි වීම
12. විද්‍යුත් තැපැල භාවිතයට ඇති හැකියාව

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(ආ)
1. අන්තර් ජාලයට පිවිසීමට උපකරණ ඇති ඕනෑම ස්ථානයක දී ලිපිගොනුවකට ඇතුල් විය හැකි වීම
2. අන්තර්ජාල සැපයුම්කරුවකු හෝ විශාල පරිගණක පද්ධතියක් අනවශ්‍ය වීම
3. දත්ත පද්ධති නඩත්තු කිරීමේ පිරිවැය අඩු වීම
4. තාක්ෂණික හා විදුලිය ඇනහිටීම් ආදී හේතු නිසා දත්ත පද්ධතියට හානි සිදු නොවීම

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

**(iii)** ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද? (ලකුණු 04 යි)

1. නිෂ්පාදිත උපාය මාර්ග
2. මිල උපාය මාර්ග
3. බෙදා හැරීමේ උපාය මාර්ග
4. ප්‍රවර්ධන උපාය මාර්ග

*ලකුණු 1 x 4 - ලකුණු 4 යි*



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු **දෙකක්** දක්වා, ව්‍යාපාරයක මුදල් ගලායාමට අදාළ අයිතම **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

1. අනාගත කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයට මුදල් ගලා ඒම් සහා ගලා යෑම් පුරෝකතනය කළ හැකි වීම
2. කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය පුරෝකතනය කළ හැකි වීම
3. මුදල් ගලා ඒම් සහ ගලා යෑම්වල ප්‍රවණතා හා රටා කලින් හඳුනා ගත හැකි වීම
4. මුදල් ලබාගත හැකි හා මුදල් යෙදවිය යුතු මාර්ග පිළිබඳව කලින් සැලසුම් කර ගත හැකි වීම

*ලකුණු 1/2 x 2 - ලකුණු 03 යි*

*අයිතම*

1. ඉඩම් හා ගොඩනැගිලි මිලට ගැනීම්
2. යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම්
3. අමුද්‍රව්‍ය මිලට ගැනීම්
4. අලෙවි වියදම්
5. පරිපාලන වියදම්
6. ණය වාරික ගෙවීම්
7. ආදායම් බදු ගෙවීම්
8. ණය පොලී ගෙවීම්

*අයිතම 3 කට ලකුණු 01 යි*
*අයිතම 2 ක් නම් ලකුණු 1/2 යි*
*අයිතම එකක් නම් ලකුණු නැත*

(v) සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතරව සත්ත්ව ගොවිපළක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ඔබට බාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. ඇස්තමේන්තුගත පිරිවැය
2. ආදායම් ප්‍රකාශය
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4. ණය ආපසු ගෙවීමේ සටහන
5. ඇස්තමේන්තුගත ශේෂපත්‍රය

යනාදිය පිළිබඳ තොරතුරු

කරුණු 4 ට ලකුණු 04 යි



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

**විද්‍යා - ගණිත**

- [ ] 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- [ ] 12-13 රසායන විද්‍යාව - 1
- [ ] 12-13 රසායන විද්‍යාව - 2
- [ ] 12-13 රසායන විද්‍යාව - 3
- [ ] 12-13 රසායන විද්‍යාව - 4
- [ ] 12-13 රසායන විද්‍යාව - 5
- [ ] 12-13 භෞතික විද්‍යාව - 1
- [ ] 12-13 භෞතික විද්‍යාව - 2
- [ ] 12-13 භෞතික විද්‍යාව - 3
- [ ] 12-13 භෞතික විද්‍යාව - 4
- [ ] 12-13 භෞතික විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 1
- [ ] 12-13 ජීව විද්‍යාව - 2
- [ ] 12-13 ජීව විද්‍යාව - 3
- [ ] 12-13 ජීව විද්‍යාව - 4
- [ ] 12-13 ජීව විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- [ ] 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 1
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 2
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 3
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- [ ] 12 ගිණුම්කරණය
- [ ] 13 ගිණුම්කරණය
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 13 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව
- [ ] 13 ආර්ථික විද්‍යාව - 1
- [ ] 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- [ ] 12 සිංහල
- [ ] 13 සිංහල
- [ ] 12 දේශපාලන විද්‍යාව
- [ ] 13 දේශපාලන විද්‍යාව
- [ ] 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 12 ඉන්දියානු ඉතිහාසය
- [ ] 13 ඉන්දියානු ඉතිහාසය
- [ ] 12 භූගෝල විද්‍යාව
- [ ] 13 භූගෝල විද්‍යාව
- [ ] 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

**English Medium**

- [ ] 12 Accounting
- [ ] 13 Accounting
- [ ] 12 Business Studies
- [ ] 13 Business Studies
- [ ] 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සාමාන්‍ය දැනීම
- [ ] 12 ගිණුම්කරණය - 1
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.